**මොරටුව විශ්වවිද්‍යාලය - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී නිකුත් කරන ලද නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු.1,900,172ක් වටිනා චෙක්පත් 175ක් නැවත ගිණුම්වලට ගෙන තිබුණද, එම ශේෂයන් 2023 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි. | අදාළ පාර්ශවයන් වෙත දැනුවත් කිරීම් සිදු කර එම ශේෂයන් ඉදිරියේදී පියවීමට කටයුතු කරනු ලබන බව. | බැරකම් නිරවුල් කිරීම සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ගෙවිය යුතු ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව දීමනා රු.1,719,675ක් නිරවුල් කර නොතිබුණි. | මේ පිළිබඳව ඉදිරියේදී සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනු ලබන බව. | බැරකම් නිරවුල් කිරීම සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලය විසින් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මිලදී ගත් ප්‍රාග්ධන භාණ්ඩ වලට අදාල රඳවුම් මුදල් එකතුව රු.1,044,385ක් හා 2012 සහ 2014 වර්ෂවලදී නිම කරන කොන්ත්‍රාත් 03ක බිල්පත් පියවීමේදී රඳවාගත් රු.2,429,936ක් 2023 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවාගත් ශේෂයන් පිළිබඳව සොයාබලා ඉදිරියේදී එම මුදල් නිදහස් කිරීමට පියවර ගනු ලබන බව. | බැරකම් නිරවුල් කිරීම සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2019 ජූලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය | 2022 දෙසැම්බර් 31 දිනට වූ රු.1,902,499,871ක් වූ ආයෝජන සහ සමාලෝචිත වර්ෂයේ සිදු කල රු.690,173,492ක් වූ ආයෝජන සඳහා අදාල විෂය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා අධ්‍යාපන ආමාත්‍යාංශය හරහා මුදල් ආමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කාලයක් ගත වන බැවින් මුදල් කමිටු නිර්දේශය හා පාලක සභා අනුමැතිය මත ආයෝජනයන් සිදු කර ඇති බව. | මුදල් පනත හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | (i) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23(අ) වගන්තිය | නේවාසිකාගාරයන්හි අපජලය පිරිපහදු කිරීම සඳහා පිරිවැය රු.36,770,496ක් වූ අපජල පිරිපහදු පද්ධති 03ක් 2016 හා 2017 වර්ෂවල ඉදිකර පිරිපහදු කාර්යයන් සිදුකර තිබුණද, ඒ සඳහා පාරිසරික බලපත්‍ර 2024 පෙබරවාරි දක්වාම ලබාගෙන නොතිබුණි. | පාරිසරික බලපත්‍රය ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | පාරිසරික පනත අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) | පනතේ වූ බලතල ප්‍රකාරව පරිසර අමාත්‍යවරයා විසින් ප්‍රසිද්ධ කරන ලද 2022 ජනවාරි 27 දිනැති අංක 2264 /17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ධාරන සීමාවන් සම්බන්ධ III(අ)වන ලැයිස්තුව | නේවාසිකාගාරයන් තුළ ස්ථාපිත පිරිපහදුවන් තුළින් බැහැර කරනු ලබන පිරිපහදු අපජලය ධාරන සීමාවන්ට අනුකූල වන බවට තහවුරු වන නියැදි පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව ඒ අවට පිහිටා ඇති පොදු කානු පද්ධතියට මුදාහරිනු ලැබ තිබුණි. | ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදයට අනුව කටයුතු කිරීමට පියවර ගනු ලබන බව. | පිරිපහදු අපජලය අදාළ ධාරන සීමාවන් තුළ පවතින බවට තහවුරු වන නියැදි පරීක්ෂණයන් කාලීනව සිදු කළ යුතුය. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 211 | වර්ෂ 02 ත් වර්ෂ 08 ත් අතර කාලයක සිට පවතින එකතු වටිනාකම රු.2,113,993ක් වූ ණයහිමි ශේෂ නිරවුල්කර නොතිබුණි. | මේ පිළිබඳ අදාළ අංශ දැනුවත් කර ඇති අතර බිල්පත් හා තත්ත්ව වාර්තා ලබාගෙන අදාළ ගෙවීම් කිරීමට උපදෙස් ලබාදෙන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.1,986,839,051ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යයන් පැමිණීම හා පිටවීම සටහන් කිරීම මඟින් සීමාකිරීම් වලට යටත් කිරීමෙන් ඵලදායී සේවාවක් ලබා ගැනීම අසීරු බව. එසේ වුවද, වැටුප් ගෙවීමේදී සෑම අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේම සේවයට පැමිණීම පිළිබඳ වාර්තා අධ්‍යයනාංශ සහ අංශ ප්‍රධානීන්ගෙන් ලබා ගත යුතු බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 4(ii) ඡේදය | 2013 වර්ෂයේ සිට පුස්තකාලයේ වාර්ෂික පොත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව, පොත් සංගණන කටයුතු ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද චක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය | බැඳුම්කර කඩ කරන ලද ආචාර්යවරුන් 20 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණු රු.45,696,764ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර කඩ කිරීමෙන් අය කරන ලද මුදල් සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා ලිපිවලට අනුව විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති බව. | භාණ්ඩාගාර උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.293,469,333ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.86,759,504ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.206,700,829ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.254,000,000කින් හා ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග රු,76,156,048කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 12 ක ඉඩමක් වර්ෂ 50 ක කාලයක් සඳහා කල්බදු ගිවිසුමක් යටතේ රු.1,400,000ක මූලික ගෙවීමක් සිදුකර 2009 ඔක්තෝබර් මාසයේදී විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන තිබුණි. බදු ගිවිසුම අනුව ඉඩමෙහි සංවර්ධන කාර්යයන් ගිවිසුමේ දින සිට අවුරුදු 02 ක් තුළ නිම කිරීමට අපොහොසත් වුවහොත් බදු ගිවිසුම ස්වයංක්‍රීයව අවලංගු වී ඉඩමෙහි සන්තකය බදු හිමියාට අයිතිවන බවට වූ කොන්දේසිය විශ්විද්‍යාලය විසින් කඩකර තිබීමෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩම වෙනත් ආයතනයකට පවරා තිබුණි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙම මුදල නැවත ලබා ගැනීම අවිනිශ්චිතව පැවතුණි. | මේ සම්බන්ධයෙන් තවදුරටත් සිහිකැඳවීම් ලිපියක් යැවීමට සහ පසුවිපරමක් සිදුකරමින් එම මුදල අයකරගැනිම සඳහා උපරිම ප්‍රයත්නයන් දරනු ලබන බව. | මෙම මුදල අයකරගැනිම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 36 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.173,752,491ක් විය. ඒ තුළ වර්ෂ 21 ත් වර්ෂ 30 ත් අතර කාලයක සිට පැවත එන නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,156,268ක් සහ වර්ෂ 31 ත් වර්ෂ 41 ත් අතර කාලයක සිට පැවත එන නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.5,826,865ක් පැවතුණි. | මෙම මුදල් අය කර ගැනීම සඳහා කටයුතු සිදුවෙමින් පවතින බව. | බැඳුම්කර කඩකළ ආචාර්යවරුන්ගෙන් මෙම මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | වෛද්‍ය පීඨයේ අවසාන වසරේ ශිෂ්‍යයන් සඳහා අත්‍යවශ්‍ය මහාචාර්ය ඒකකයන්හි සායනික පුහුණුව 2025 ජනවාරි වන විට ආරම්භ විමට නියමිත වුවත්, දැනට සායනික පුහුණුව ලබාදෙන නාගොඩ රෝහල තුළ එම පහසුකම් නොමැති බැවින් 2023 නොවැම්බර් 15 දින පැවැති පොදු ව්‍යාපාර කාරක සභාව සහ මීට පෙර ලබා දුන් අමාත්‍ය මණ්ඩල තිරණයට අනුව මෙම සායනික පුහුණුව සඳහා නෙවිල් ප්‍රනාන්දු රෝහල භාවිතා කිරිමට නිර්දේශ කර තිබුණ ද, එම නිර්දේශයන් 2024 අප්‍රේල් දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි. ඒ අනුව 2025 ජනවාරි වනවිට නෙවිල් ප්‍රනාන්දු රෝහල මෙම මහාචාර්ය ඒකක වලින් යුත් රජයේ රෝහලක් ලෙසට පවත්වාගෙන යාමට අපොහොසත් වුවහොත් වෛද්‍ය පීඨයේ අවසාන වසරේ සිසුන්ට නියමිත කාල වකවානුව තුළදි වෛද්‍ය උපාධිය ලබා ගැනිමේ දැඩි අවධානමකට මුහුණ දීමට සිදුවිය හැක. | මෙම ගැටලුව නිරාකරණය කිරිම සඳහා 2024.05.17 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී සාකච්ජාවක් පැවතිණි. එහිදි නෙවිල් ප්‍රනාන්දු රෝහල පවරා ගැනිමට සහ එහි කටයුතු ජූලි, අගෝස්තු මාස වන විට ආරම්භ කිරීමට සහ අධ්‍යයන කටයුතු සයිටම්හි කරගෙන යැමට අවශ්‍ය පහසුකම් හා මූල්‍ය ප්‍රතිපාදන ලබාදිමට එකඟතාවය පලවී ඇති බව. ඒ අනුව එම කටයුතු බාධාවකින් තොරව සිදුවුවහොත් 2025 ජනවාරි වන විට අවසන් වසර සිසුන්ගේ සායන කටයුතු පිළිබඳ ගැටලුවක් නොපවතින බව. | අවසන් වසර සිසුන්ගේ සායනික පුහුණුව සඳහා අවශ්‍ය වන පහසුකම් කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කථිකාචාර්යවරුන් වෙත ප්‍රදානය කළ රු.83,577,700ක් වූ දිගුකාලින පර්යේෂණ 66ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. එමෙන්ම ඒ තුළ 2016 වර්ෂය තුළ අනුමත කරන ලද රු.4,112,000ක් වටිනා පර්යේෂණ ප්‍රදාන 06 ක්ද පැවතුණි. | නිම කිරීමට ප්‍රමාද වී ඇති පර්යේෂණ ප්‍රදාන සම්න්ධ කටයුතු කඩිනම් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති බව. | පර්යේෂණ ප්‍රදානය න් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |

**3.2 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලීය අධ්‍යයන හා පරිපාලන කටයුතු වලට සම්බන්ධ ඉහළ නිලධාරින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයකින් යුත් යුනිකන්සල්ටන්සි සර්විස් සමාගම ස්ථාපිත කර විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යාම සම්බන්ධව 2014 නොවැම්බර් 20 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා සාකච්ඡාවට අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට නිර්දේශ කර තිබුණද, 2024 මැයි දක්වා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව කටයුතු කිරිම සඳහා අවශ්‍ය තොරතුරු දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බව. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල හා පාඨමාලා සංවර්ධන අරමුදල යටතේ පවත්නා අරමුදල් ගිණුම් 91ක රු.264,698,078ක ශේෂයක් පැවතුණි. අරමුදල් 15ක පැවති එකතුව රු.5,602,090ක් අවුරුදු 07 ක සිට උපයෝජනය කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල සඳහා මුදල් ලැබෙනුයේ අදාළ අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ස්වයං මූල්‍ය පදනම මත සිදු කරනු ලබන විවිධ පාඨමාලා පර්යේෂණ සහ උපදේශන සේවා මඟින් බවත් අරමුදල් එක් වර්ෂයක් හෝ වර්ෂ කිහිපයක් උපයෝජනය නොවී පැවතියත් ඒවා ඉදිරියේදී අදාළ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබනු බවත්. | අදාල අරමුදල් විශ්වවිද්‍යාලයේ අවශ්‍යතා සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | පරිත්‍යාග අරමුදල් 06 ක් සඳහා ලැබීම් රු.1,127,010ක් ඇතුළුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.22,056,082 ක් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම පරිත්‍යාග අරමුදල් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බලා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | අදාළ අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 සිට වර්ෂ 13 අතර කාලයක් තුළ පවතින එකතු වටිනාකම රු.19,386,959ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 27කින් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මෙම ශිෂ්‍යත්ව අරමුදල් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | වර්තමානයට ගැලපෙන ලෙස නව නිර්ණායක සකස් කර මෙම අරමුදල් උපයෝජනය සඳහා පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පාලක සභා තීරණ අනුව, දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින ශිෂ්‍යත්ව අරමුදල් 22 ක එකතුව රු.3,356,683ක් 2020 දෙසැම්බර් 31 දින සම්මාන සහ ශිෂ්‍යත්ව (Awards & Scholarship Account) නමැති නව අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. මෙම අරමුදලින් ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍යවන්නා වූ නිර්ණායක 2023 දෙසැම්බර් 31 වන විටත් සකස් කර නොතිබුණු බැවින් එදිනට පැවති රු.13,791,376 ක ශේෂය උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | ශිෂ්‍යත්ව ගෙවීම සඳහා නිර්ණායක සකස් කිරීමට කඩිනමින් පියවර ගනු ලබන බව. | අදාළ නිර්ණායක කඩිනමින් සකස් කර අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂය තුළ හා ඊට පෙර මිලදී ගෙන තිබුණු රු.2,850,097 ක් වටිනා ටෝනර් සහ කාට්‍රිජ් 340ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි. | මෙම ගබඩාවේ පවතින ටෝනර් කාට්‍රිජ් සම්බන්ධයෙන් පාලක සභාව විසින් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ අනුව මෙම තොගය සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | කමිටු වාර්තාව කඩිනමින් ලබාගෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) නේවාසිකාගාරයක වහලය අබලන් වී අවදානම්ව පැවතීම මත දිගුකලක සිට එම නේවාසිකාගාරය වසා දමා තිබුණු අතර නව නේවාසිකාගාර සංකීර්ණයෙහි තෙවන මහලේ වහලය දිරාපත් වී අවදානම් තත්ත්වයේ පැවතීම හේතුවෙන් එම මහලේ ශිෂ්‍යයින් 24 දෙනෙකුට නවාතැන් ගතහැකි කාමර 06ක් ද වසා දමා තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒවා අලුත්වැඩියාකර නොතිබුණි. එමෙන්ම, සිසුන් 86ක් සඳහා එකවර නේවාසිකාගාර පහසුකම් ලබා දිය හැකි නේවාසිකාගාරයක කාමර වෙන්කිරීමකින් තොරව ශාලාවක් ලෙස පැවතීමත් අනෙකුත් පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීමත් මත නේවාසිකාගාර පහසුකම් ලබමින් සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 12ක් විය. | මෙම නඩත්තු කටයුතු කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ඒවා ඉක්මණින් නිම කිරීමට කටයුතු කරනු ලබන බව. | නඩත්තු කටයුතු කඩිනමින් නිම කර සිසුන් සඳහා ප්‍රමාණවත් නේවාසිකාගාර පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය ආපනශාලාව තුළින් බැහැර කරන ආහාර අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ජීවවායුව නිෂ්පාදනය කර එම වායුව ආපනශාලාවල ආහාර පිසීම සඳහා භාවිතයට ගැනීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2017 පෙබරවාරි 22 දින වන විට රු.1,434,319 ක වියදමක් දරා ජීව වායු නිපදවන පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. එහි නිපදවන ජීවවායු ප්‍රමාණය ආපනශාලාවේ උඳුන් දැල්වීමට ප්‍රමාණවත් නොවන බැවින් වායු පද්ධතියේ ධාරිතාව වැඩි කිරීමට යෝජනා වී තිබුණ ද, 2024 අප්‍රේල් 30 දින දක්වා පද්ධතියේ ධාරිතාව වැඩිදියුණු කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත පුනරුත්ථාපන වියදම රු.මිලියන 1.5 ක් බව අදාළ මහාචාර්යවරයා විසින් දැනුම් දී ඇත. ඒ අනුව අදාළ අනුමැතීන්ට යටත්ව මෙම ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කරන ලෙසට නිර්දේශ කර ඇති අතර ඒ අනුව කටයුතු කිරිමට පියවර ගනු ලබන බව. | මෙම ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කටයුතු අප්‍රමාදව නිමකිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී පළමු අදියරේ වැඩ නිමකර තිබුණු වාස්තු විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ හා ඉංජිනේරු පීඨය සඳහා ඉදිකරන ලද බහු කාර්යය ගොඩනැගිල්ලේ වහලවල්වල තහඩු එම ගොඩනැගිලි භාවිතයට ගැනීමටත් ප්‍රථම දිරාගොස් ජලය කාන්දු වීම හේතුවෙන් ඒවා ඉවත් කර නැවත තහඩු ඇතිරීම සඳහා රු.14,056,253ක අමතර පිරිවැයක් දරා තිබුණි. මෙම මුදල උපදේශක සේවා සැපයූ ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදේශන ආයතනය විසින් ඉදිරිපත් කර ඇති කාර්යසාධන සහතිකය මඟින් වැඩ කටයුතු නියමිත පරිදි නිමකර ඇති බව තහවුරු කර ඇත. විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවූ අතිරේක වැය බර හුදෙක්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නොසැලකිල්ල මත සිදුවූවක් නම් එම මුදල ඔවුන්ගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් විමසීමක් කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිත බව. | ප්‍රමිතියට අනුකූල නොවන ඉදිකිරීම් මත සිදුව ඇති අලාභය උපදේශක සේවා ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේදී ඉංජිනේරු පීඨය වෙනුවෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ලට අදාළ කොන්ත්‍රාත් ලේඛනයෙහි වහල සෑදිම සඳහා වන පිරිවිතරයට අනුව රස්නය හා ශබ්දයට ඔරොත්තු දෙන ලෙසට සින්ක් ඇලුමිනියම් වලින් ආවරණය කල තහඩු වහලක් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.6,000,000ක් වෙන්කර ගෙවීම් කර තිබුණි. පසුව මෙහි ශේෂ වැඩ නිම කිරිම සඳහා | කොන්ත්‍රාත් ගිවිසුමෙහි සඳහන් මි.මි. 16 Plywood sheet යෙදීම වෙනුවට ඒ සඳහා ද ප්‍රමිතියෙන් යුතු Zn/ Al තහඩු යෙදීමට විශ්වවිද්‍යාලය විසින් උපදෙස් ලබා දී ඇති බව. ගොඩනැගිල්ල බාරගන්නා අවස්ථාව වන විට මෙම අයිතමයන් නිසි ප්‍රමිතියට අනුව නිම කර තිබූ බවට උපදේශන ආයතනයේ සහතිකය මත විශ්වවිද්‍යාලය විසින් ගොඩනැගිල්ල බාරගන්නා ලදී. දෙවන අදියර සඳහා ඇස්තමේන්තු සකස් | අමතරව ගෙවීම් කරන ලද මුදල උපදේශක සේවා ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදානය කල නව කොන්ත්‍රාත්තුව යටතේද නැවත වහලය සඳහා ශබ්ද පරිවාරකයක් ( Sound barrier ) ඇතිරීම සඳහා රු.5,356,600ක් ගෙවා තිබුණි. ඒ අනුව මුල් පිරිවිතරයන්ට අනුව ශබ්ධ පරිවාරකය නිසි ප්‍රමිතියකින් යුක්තව ඉටුකර නොගෙන ශේෂ වැඩ කොන්ත්‍රාත්තුව යටතේ නැවත ගෙවීම් කර එම කාර්යයම ඉටුකරවා ගෙන තිබුණි. | කිරීමේදී එම උපදේශන ආයතනය විසින්ම මි.මි.50 සනැති ශබ්ධ පරිවාරකයන් යෙදීමට ගිවිසුම් ප්‍රමාණ පත්‍රයට ඇතුළත් කර ඇත. එහෙයින් මෙම කරුණ පිළිබඳ විස්තර ලබා දෙන ලෙසට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලිඛිතව දන්වා ඇති බැවින් ලබා දෙනු ලබන පැහැදිලි කිරීම් ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කරන බව. | |
| (ඈ) | විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය සඳහා ඉදි කරන ලද දේශන ශාලාව සහිත ගොඩනැගිල්ල සහ ඉංජිනේරු පීඨයේ ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ලේ උපදේශක ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කළ ද උපදේශක සේවාවන් නියමිත පරිදි ඉටුනොකිරීම හේතුවෙන් ආයතනයට වන අලාභ හානි අය කරගැනීම සඳහා වෘත්තීය වගකීම පිළිබඳ රක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදේශක සේවා ආයතනය විසින් වෘත්තීය වගකීම් පිළිබඳ රක්ෂණයක් ලබා ගැනීමට අවශ්‍ය බව සත්‍යයකි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා විශ්වවිද්‍යාලය අතර ඇති කරගන්නා ලද ගිවිසුමේ වගන්ති අංක 04 යටතේ උපදේශන ආයතනයේ වගකීම පිළිබඳව පැහැදිලි කර ඇති අතර ඒ අනුව උපදේශන ආයතන ඒ සඳහා බැඳී සිටින බව. | උපදේශක සේවා සඳහා වෘත්තීය වගකීම් පිළිබඳ රක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 316 ක් සම්පූර්ණ කර නොගැනීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන දේශන ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.49,718,264ක් ගෙවීම් කර තිබුණි. | අදාළ තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉල්ලුම් කර නොමැති වීමෙන් අදාළ පුරප්පාඩු පිරවීමට නොහැකි වන අතර එවිට අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමට සිදු වන බව. | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2024 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ 2024 අගෝස්තු 15 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අයත් වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කළ යුතු සියලු කටයුතු සම්පාදනය කොට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සභාගත කිරීමට දැනුම් දී ඇත. ඉදිරියේදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |